රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2017(I)

මගේ අංකය: EST-7/ALLOW/04/2060-3
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.08.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2017.02.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017හි 11 ඡේදයට ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 11 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රායෝගික පුහුණුව ලබන අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීමේ දී අදාළ ආයතන හෝ පුහුණුව ලබන්නා සමඟ 1990 අංක 20 දරන පනතේ 65 වන වගන්තියේ විධිවිධාන අනුව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන පනතේ විධිවිධාන ප්‍රකාරව එළඹිය යුතු ගිවිසුමක හැර වෙනත් කිසිදු ගිවිසුමකට ඇතුළත් නොවිය යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය